ISSN 2362-0412

# මහජන පුස්තකාලවල අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් භාවිතය (මාතර දිස්ත්‍රික්කයේ මහජන පුස්තකාල ඇසුරින්)

ආර්.ඒ.පී.එස්. සෙනෙවිරත්න*

සහකාර පුස්තකාලයාධිපති, ප්‍රධාන පුස්තකාලය, රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

**සාරසංක්ෂේපය**

පුස්තකාල සේවා අවශ්‍ය සැමට පොදුවේ සේවය සපයන ආයතනයක් ලෙස මහජන පුස්තකාලය හැඳින්විය හැකිය. පුස්තකාල සේවා අතරතොරතුරු සේවා, අධ්‍යාපනය, විනෝදාස්වාදය, වින්දනය හා ඇගයීම අරමුණු කර විශාල පරාසයක සේවා සපයන ආයතනයක් වේ. කුඩා දරුවාගේ සිට මහල්ලා දක්වා ජාති, කුල, ආගම්, වයස්, සමාජීය හා ආර්ථික තත්ත්වයන්, තරාතිරම් භේදයකින් තොරව සේවාවන් සපයන එකම පුස්තකාල වර්ගයයි. සැමට එක සේ සේවා සැපයීමේදී වර්තමානයේ පුස්තකාල මුහුණපාන ප්‍රධාන ගැටලු වන්නේ තොරතුරු මූලාශ්‍ර සීග්‍රයෙන් බිහිවීමත්, මූල්‍ය ප්‍රතිපාදන සීමිතවීමත්, පාඨක අවශ්‍යතා අසීමිතවීමත් යන සාධක වේ. මෙයට ඇති හොඳම විසඳුම වන්නේ අන්තර් පුස්තකාල සහයෝගිතා ක්‍රම පුස්තකාල අතර පවත්වා ගෙන යාමයි. මහජන පුස්තකාල අතර මේ වන විට අන්තර් පුස්තකාල සහයෝගිතාවය ක්‍රියාත්මක වන ආකාරයත්, දැනට ක්‍රියාත්මකවන අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් පිළිබඳවත්, පුස්තකාල සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පුස්තකාලයාධිපතිවරුන්ට මතුවන බාධා මෙන්ම ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳවත්අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණු වේ.මාතර දිස්ත්‍රික්කයේ මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා යටතේ ක්‍රියාත්මක වන මහජන පුස්තකාලවල පුස්තකාලයාධිපතිවරුන් හා සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් දත්ත ලබා ගැනීම සිදු කරන ලදි. දත්ත විශ්ලේෂණය මගින් අනාවරණය වූයේ මහජන පුස්තකාලවල ප්‍රමාණවත් පරිදි පුස්තකාල සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක නොවන බවයි. දැනට යම් මට්ටමකින් හෝ ක්‍රියාත්මක වන්නේ පුස්තකාල කාර්යය මණ්ඩල පුහුණු වැඩසටහන් පමණි. සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ පුස්තකාල අතර පවතින නීතිමය තත්ත්වයන්, සමහර පුස්තකාල විසින් අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා කැමත්තක් නොදැක්වීම, කාර්යය මණ්ඩලය තුළ පවතින අඩු ආකල්පය, එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් තරම් මූල්‍ය සම්පත් හා මානව සම්පත් නොමැතිවීම, කාර්යය මණ්ඩලයේ සිටින සමහර පුද්ගලයන් තුළ පුස්තකාල සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තරම් ප්‍රමාණවත් දැනුමක් හා අවබෝධයක් නොමැතිකම, එවැනි වැඩසටහන් වල ඇති වැදගත්කම පිළිබඳ ඉහළ නිලධාරින්ගේ අවධානය යොමු නොවීම යන කරුණු ද දත්ත විශ්ලේෂණයෙන් ලද නිගමන වේ. අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් මහජන පුස්තකාලවල ක්‍රියාත්මක කිරීමෙහි ඇති වැදගත්කම හා එහි අවශ්‍යතාවය පිළිබඳ ඉහළ බලධාරින්ට මෙන්ම පුස්තකාල කාර්යය මණ්ඩලයට නිසි අවබෝධයක් ලබාදීම, පුස්තකාලයාධිපතිවරුන් සඳහා වැඩමුළු, සම්මන්ත්‍රණ හා දේශන මගින් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීම, ප්‍රතිපත්තියක් වශයෙන් අන්තර් පුස්තකාල සහයෝගිතා වැඩසටහන් මහජන පුස්තකාල තුල ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීම හා එහිදී සාමූහික ප්‍රතිග්‍රහණය, සාමූහික සූචිකරණය, සාමූහික ග්‍රන්ථ පිරිසැකසුම, සාමූහික විමර්ශනය, සාමූහික ගබඩාකරණය, සාමූහික කාර්යය මණ්ඩල පුහුණුව හා උපකරණ හුවමාරුව යනාදි වැඩසටහන් කෙරෙහි වැඩි අවධානය යොමු කිරීම සුදුසු බව යෝජනා කල හැකිය.

යොමු පද : මහජන පුස්තකාල, පුස්තකාල සහයෝගිතාවය, අන්තර් පුස්තකාල සහයෝගිතාවය, සම්පත් හුවමාරුව

*සමායෝජක කතෘ: saku@lib.ruh.ac.lk